**ලංසු කැඳවීමේ ආරාධනාවයි.**

**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල**

**ආයතනික පවිත්‍රතා හා නඩත්තු සේවාව 2026/2027**

01. පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2026/2027 වර්ෂයට ඉහත සේවාව ලබා ගැනීම සඳහා ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අසාධු ලේඛනගත නොවූ සුදුසුකම් ලත් සේවා සැපයුම්කරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීම සඳහා ආරාධනා කරනු ලැබේ.
02. අදාළ සේවාව සැපයීම සම්බන්ධව ලංසු ඉදිරිපත් කල යුත්තේ සමාගම් රෙජිස්ට්‍රාර්/සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා යටතේ ලියාපදිංචි කළ සමාගමක්/ සමුපකාර සමිතියක්/සංගමයක් පමණි
03. ලංසුවලට අදාළ වැඩිමනත් විස්තර පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්යාල වේලාවන්හිදී දුරකථන අංක 0812- 2498680 මගින් හෝ ප්‍රසම්පාදන අංශය අමතා පැමිණ ලබා ගත හැකිය.
04. පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගිණුම් අංශය වෙත ආපසු ගෙවනු නොලබන ලංසු ලියවිලි ගාස්තු වශයෙන් රුපියල් **3500/=** ක් මුදලින් ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් **2026.03.16 දින සිට 2026.03.30** දින දක්වා සතියේ වැඩකරන දිනවලදී පෙ.ව **9.00 සිට** ප.ව **3.00 දක්වා** කාලය තුළ ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලේඛන ලබා ගත හැකිය. මෙම ලංසු ලේඛන මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පිටපත් දෙකකින් සකස් කර ලංසු ඇපකරය සමඟ මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව නම්කර මුද්‍රා තබා එක් කවරයක බහා **2026.03.31 දින ප.ව 2.30 ට හෝ ඊට පෙර** ලැබෙන සේ **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැකිය. ලංසු ලේඛන ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙළවරේ **" පවිත්‍රතා හා නඩත්තු සේවාව සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම 2026/2027"** යනුවෙන් සඳහන් කළ යුතුය.
06. පූර්ව ලංසු රැස්වීම **2026.03.25 දින පෙ.ව 10.30** ට ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේදී පැවැත්වේ.
07. ප්‍රමාද වී හෝ නියමිත උපදෙස් පරිදි ඉදිරිපත් නොකරන ලද ලංසු ලේඛන දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
08. ශ්‍රී ලංකා මහබැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත්, පහත වගුවේ සඳහන් වටිනාකමින් යුතු සහ ලංසු ලේඛන විවෘත කරන දින සිට වලංගු දින 105 කින් යුතු කොන්දේසි විරහිත , නැවත ගෙවනු ලබන ලංසු සුරක්ෂණ ඇපකරයක් හෝ ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගිණුම් අංශය වෙත සිදුකරන ලද නැවත ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදලක් තැන්පත් කිරීම සඳහා වූ ලදුපත ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | සේවාව | ලංසු සුරක්ෂණයේ වටිනාකම | | ලංසු සුරක්ෂණය සඳහා වලංගු දින ගණන |
|---|---|---|---|---|
| | | බැංකු ඇපකරය මගින් (රු) | මුදලින් (රු) | |
| 01 | පවිත්‍රතා හා නඩත්තු සේවාව | 150,000 | 150,000 | 105 |

09. **ලංසුපත් විවෘත කිරීම 2026.03.31 දින ප.ව 2.45 ට** ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේදී සිදු කෙරේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ විධිමත් අවසරය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.
10. ඉදිරිපත්වූ ලංසු ලේඛන අතරින් යෝග්‍ය ලංසු ලේඛන පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසු ලේඛන ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර , ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල.
2026.03.13